# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2254/39 – 2021 නොවැම්බර් 19 වැනි සිකුරාදා – 2021.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2011 සැප්තැම්බර් මස 27 වැනි දින අංක 1725/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2011 අංක 229 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 13/97/LRB/599.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: GCF/ATH/KD/24/LR.
2021 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලංගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2021/372 හා 2021.10.08 දිනැති අනුරේඛනයේ දැක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – පොලොන්ගහ කුඹුර පනාගොඩ කුඹුර කැටගොඩගේ කුඹුර, වැටකයියාපොත කුඹුර, අතපත්තු කුඹුර, කැටකැලගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0322**

උතුරට: කපන ලද කාණුව සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: මු.පි.කො. 9304 හි කැබලි අංක 12 සහ කැබලි අක්ෂර C; දකුණට: කැබලි අක්ෂර D; බටහිරට: කපන ලද කාණුව සහ මු.පි.කො. 9304 හි කැබලි අංක 13.

11 – 804

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1917/40 හා 2015.06.04 වැනි දින දරන *රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2015 අංක 95 හා 2015.05.28 වැනි දින දරන ආඥාවේ

සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1917/40 හා 2015.06.04 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2015 අංක 95 හා 2015.05.28 වැනි දින දරන ආඥාවට අදාළව සකස් කරන ලද මූ.පි.ගා 4274 හි කැබලි අංක 21 සහ 25 (අනුරේඛන අංක GA/IMD/2015/533 හි W සහ Y2) වශයෙන් පෙන්වා ඇති ඉඩම් කොටස් 2 පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/12/2014/UDA/41.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DS/IMA/LAN/05/03/02-II.
2021 නොවැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 172-ඉමදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉමදූව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූ.පි.ගා. 4274 හි පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 21 – කුමාරයාකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0138**
උතුරට: කැබලි අංක 20 සහ මුපි ගා 4089 හි කැබලි අංක 38; නැගෙනහිරට: මුපි ගා 4089 හි කැබලි අංක 38 සහ කේ. ඒ. බෝධිපාල හිමිකම් කියන කුමාරයාකුඹුර; දකුණට: කේ. ඒ. බෝධිපාල හිමිකම් කියන කුමාරයාකුඹුර සහ මෙම පිඹුරේ කැබලි අංක 23; බටහිරට: කැබලි අංක 20.

02. **කැබලි අංක 25 – කුමාරයාකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0162**
උතුරට: මුපි ගා 4089 හි කැබලි අංක 40 සහ කැබලි අංක 26; නැගෙනහිරට: කැබලි අංක 26, මුපි ගා 4089 හි කැබලි අංක 41 සහ කේ. එච්. ප්‍රියන්ත හිමිකම් කියන කුමාරයාකුඹුර; දකුණට: කේ. එච්. ප්‍රියන්ත හිමිකම් කියන කුමාරයාකුඹුර සහ මෙම පිඹුරේ කැබලි අංක 27; බටහිරට: කැබලි අංක 24.

11 – 805

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.